
## කවි කොළය



# නිදහස නෑ....? මේ තියෙන්නෙ නිදහස !

හැට වසරක්ම ඔසවා නිදහස් කොඩිය
ආ පස්සටම යමු අපි අඩියෙන් අඩිය
සැරසෙන අයට තරකරගන්නට මඩිය
නිදහස තිබේ මෙහි ඕනෑවට වැඩිය

ඇමිණී වරදකට නීතියෙ බිලි පිත්තේ
යන්නට සිදුවුනොත් මහ උළු ගෙය පැත්තේ
සුවසේ සිටින්නට රෝහල ඇඳ මත්තේ
මන්තිරි ඇමති පුතුනට නිදහස ඇත්තේ

නිදහස ලබාගෙන ආදායම් බද් දෙන්
වහගෙන සියළු පස්පව් ඇඳි සුදු රෙද් දෙන්
පෙන්ෂන් ලබාගන්නට පස් අවුරුද් දෙන්
නිදහස තිබේ මේ රට තුළ සහ සුද්දෙන්

විකුණනු බැරිව වී ටික මහ ගිනි ජාල
ගොඩකට මැදිව වස බොද්දී ගොවි රාළ
රුපියල් අසූවට විකුණන්නට හාල
නිදහස තිබේ හිම්කරුවට වී මෝල

ඒ මේ අතට පැන පැන පන්නන පිලී
පාරලිමේන්තුවෙ ‘පන්කෝටියෙ’ කැලී
සමගින් කළුකඩේ පින්බර මුද ලාලී
නිදහස් සුවය ලැබ සැනසෙති සුව සීලී


අද නම් කතරගම වත් සිංහල යන්ට
බැරිමුත් නිදහසේ ගොස් ආපසු එන්ට
අපගේ සහෝදර සුළු ජාතික යන්ට
නිදහස තිබේ ලංකාවෙම ඇවිදින්ට

ලැබ ගන්නා පිණිස යම් යම් වර දාන
අසරණ රෝගියා බිල්ලට ඇද දාන
දොස්තර මහතුන්ට වැඩවැරුමට ඕන
නිදහස තිබේ කළඳක්වත් අඩු නූන

ගිවිසුම් වලින් බැඳ සූරාකමින් රට
හිතූ හිතූ වෙලාවට මිළ වැඩි කරන් නට
මෙරටෙහි ගෑස් කොම්පැණිකාරයන් හට
නිදහස ලබා දී ඇත නීතියෙන් පිට

තෙල් මිළ වතුර බිල ඩීසල් විදුලි බිල
අහසට පියාඹද්දී පොල් ගෙඩියෙ මිළ
නෙලමින් නිදහසේ උපරිම මහඟු පල
කරබාගෙන සිටිති ගරුතර ඇමති පෙළ

තොණ්ඩුව වැටෙන්නට
හිටියත් ගෙල මත්තේ
මිනිමරුවාට ගැලවෙන
නිදහස ඇත්තේ
එල්ලුම් ගහ නොමැත
දැන් වැලිකඩ පැත්තේ
මොන මළ යකාටද
මෙහි නිදහස නැත්තේ?



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# ලන්ඩනයේ සමාධි භාවනා මධ්‍යස්ථානය

ලන්ඩන් නගරයේ එඩ්මන්ටන්හි සමාධි භාවනා මධ්‍යස්ථානය පිහිටුවා සිව්වසරක් පිරීම නිමිත්තෙන් 2008 පෙබරවාරි මස 23 වන සෙනසුරාදා සාංවත්සරික උත්සවයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම අවස්ථාවට එංගලන්තයේ විහාරස්ථාන වලින් මෙන්ම ජර්මනියේ හා ඉතාලියේ විහාරයන්ගෙන්ද ස්වාමීන්වහන්සේලා වැඩම කරති. ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස්තුමියද සහභාගිවීමට නියමිතය.

2004 පෙබරවාරි 21 වෙනි දින මැන්චෙස්ටර් කේතුමතී විහාරාධිපති පූජ්‍ය පිදිවිල්ලේ පියතිස්ස නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් ඇරඹි මෙම භාවනා මධ්‍යස්ථානයේ නායකත්වය උසුලන්නේ වේයන්ගොඩ මාරාපොළ පුරාණ මහ සුවිසුද්ධාරාමාධිපති ගුන්නැපානේ සුමනාරාම ස්වාමීන් වහන්සේය. උන්වහන්සේගේ උත්සාහය සහ දැඩි කැපවීම මත ඉතා කෙටි කාලයක් තුළ දී ස්ථිර විහාරස්ථානයක් බවට පත්විය. පළමු වසරේම ශ්‍රී මහාබෝධි ශාඛාවක් වැඩමවා විශේෂ පින්කම් මාලාවක් සිදුකරන ලදී.

දැනට විහාරස්ථානයේ තැන්පත්කර ඇති සමාධි ප්‍රතිමාව වැඩම කරවන ලද්දේ ජයසිරි ලොකු අඩක්සූරිය මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් විසිනි. මෙම විහාරස්ථානයේ වැඩවසන සර්වඥ ධාතූන්වහන්සේලා වැඩම කරවීමට ලැබීම මගේ භාග්‍යයක් කොට සලකමි.

බුදු දහම ප්‍රචාරය කිරීමට ගන්නා අවංක උත්සාහයේ ප්‍රතිපලයක් වශයෙන් ඉංග්‍රීසි ජාතිකයන් ඇතුළු විවිධ ජාතිකයින් බොහෝ දෙනෙක් විහාරස්ථානයට සම්බන්ධව ආගමානුකූලව ජීවත්වෙති. මේ අය අතුරින් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට ගොස් තාවකාලිකව පැවිදිභාවය ලබා මනා අයුරින් ගුණදහම් පුරුදුවීය. ඉංග්‍රීසි ජාතිකයෙකු වන මාර්ක් ඩොයිලි මහතා මහින්ද නමින් බෞද්ධයෙකු බවට පත්ව දැනට විහාරස්ථානයේ භාණ්ඩාගාරිකවරයා වශයෙන් කටයුතු කරයි.

දිනපතා ආගමික වතාවත් සහ සති අග භාවනා පන්ති පැවැත්වෙන සමාධි භාවනා මධ්‍යස්ථානයෙහි කඨීන මහා පිංකම වැනි විවිධ ආගමික උත්සවයන් හා ජාතික උත්සවයන් වාර්ෂිකව පැවැත්වෙයි. සති අග පැවැත්වෙන භාවනා වැඩසටහන සඳහා ඉංග්‍රීසි ජාතිකයන් මෙන්ම විවිධ ජාතීන්ට අයත් බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනෙක් සහභාගි වෙති. විහාරස්ථානය හා සම්බන්ධ මැන්චෙස්ටර්හි කේතුමතී විහාරය, බර්මිංහැම් විහාරය, ලෙව්වර්ත් ධම්ම නිකේතනය මෙන්ම, විශේෂයෙන් බඹරකොටුවේ ආනන්ද මංගල ස්වාමීන් වහන්සේ ද විහාරස්ථානයේ කටයුතු සඳහා නන් අයුරින් සහය දෙති.

වසර හතරක් සපිරෙන මෙම සමාධි භාවනා මධ්‍යස්ථානය තව තවත් දියුණු වී උතුම් බුදුදහමේ අමා සුවඳ විහිදුවන්නට මධ්‍යස්ථානාධිපති සුමනාරාම ස්වාමීන් වහන්සේට ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි පතමි. භාවනා මධ්‍යස්ථානයේ පැවැත්ම සහ අභිවෘද්ධිය පතා ආධාර උපකාර කරමින් ඒ සඳහා අනුබල ලබා දෙන සියළුම පිංවතුන්ට ධර්මාවබෝධය ලැබේවායි පතමි.

♦ චන්ද්‍රා විජේසුන්දර Walthamstow **London E17**

# ඒ නම් බුද්ධාගම නෙවෙයි

අනේ මේ බෞද්ධයින්ද යනුවෙන් පසුගිය ලංකාවිත්ති කලාපයකට මා ලියූ ලිපියකට ප්‍රියා ද සිල්වා නම් මහත්මියක් පිළිතුරක් ලියා තිබුණා. මේ සටහන එයට පිළිතුරු වශයෙනුයි.

මම බලාපොරොත්තු වුණේ මට වඩා බුද්ධාගම ගැන දන්න කෙනෙක් ග්‍රහ අපල වලට පිරිත් කියපු අවස්ථා ඇත්නම් ඒවා පෙන්නලා දේවි කියලා. මම ලියුවේ දෙවියන්ට පින්දීම ගැන නෙවෙයි. මම ලිව්වේ එක්තරා අවස්ථාවකදි පන්සලක පිරිත් කියලා ඉවරවෙලා, ග්‍රහ අපල වලින් මිදෙන්න කියලා ඉල්ලපු එක ගැනයි. මම දන්න විදියට ග්‍රහයෝ දෙවියෝ නොවෙයි.

දෙවියන්ට පිං දෙන එකේ වැරැද්දක් ඇති කියලා මම හිතන්නෙ නැහැ. මොකද ඒක දානයක් නිසා. දෙවියෝ අදහන එක මගේ අදහස හැටියට මිත්‍යා දෘෂ්ටියක්. දෙවියෙ-ා් අදහන අය අදහන්නේ සර්වබල ධාරී අමරණීය දෙවියන්. අපි බෞද්ධයෝ හැටියට විස්වාස කරන අනියත බවට සම්පූර්ණයෙන්ම විරුද්ධ අදහසක්.

දෙවියන්ට පිං දීලා පිහිට ඉල්ලන එක හරියට දේශපාලකයෙකුට ඡන්දෙ දීලා රස්සාවක් බලාපොරොත්තු වෙනවා වගේ වැඩක්. ඒක දානයක් නොවෙයි. පගාවක්. මම දන්නවා ලංකාවෙ හැම පන්සලකම වාගේ දේවාලයක් තියෙනවා. දළදා මාලිගාවෙත් තියෙනවා. කතරගම දේවාලෙ තියෙන්නෙ කිරිවෙහෙර තියෙන භූමියේ. වැඩිපුර බෞද්ධයො කතරගම යන්නෙ දේවාලෙට මිසක් කිරිවෙහෙර ගැන හිතලා නෙවෙයි.

ප්‍රියා ද සිල්වාට දේවාරක්ෂාව ලැබුණා කියනඑක ගැන මට මුකුත් කියන්න පුළුවන් කමක් නැහැ. මට දේවාරක්ෂාව ලැබිලත් නැහැ. දන්න කාලෙක ඉල්ලලත් නැහැ.

දෙවිවරු බුදුහාමුදුරුවො මුණ ගැහිලා ප්‍රශ්න අහපු බව බෞද්ධ සාහිත්‍යයෙත් තියෙනවා. මංගල සූත්‍රයේ එහෙම දෙවියො ගැන සඳහන් වෙනවා. ඒ අමරණීය සර්වබලධාරී දෙවියෝ නෙවෙයි. කී දෙනෙක් දෙවියන්ට පින්දීලා පිහිට ඉල්ලනවද? සාහිත්‍ය යේ එන දෙවිවරු පින්කරලා අපිට නොපෙනෙන ලෙස ජීවත්වෙන කොටසක්. එහෙම අය ඉන්නවද, අපට ඒ අයගෙ බැල්ම පිහිට තියෙන වද කියන එක ගැන මට දැනීමක් නැහැ. නමුත් මම අදහන බුද්ධා ගමට ඒගොල්ලෝ අවශ්‍ය නැහැ.

මම ලියුවේ ග්‍රහයො ගැනයි, ග්‍රහ අපල දුරුවෙන්න කියලා කවි කියපු එක ගැනයි. මිලියන ගණනක් විස්-වාස කළ පමණින් කිසි දෙයක් ඇත්ත වෙන්නෙ නැහැ. පොළව පැතලිය කියලා තවමත් විස්වාස කරන අය ඕන තරම් ඉන්නවා. දෙවියෝ ලෝකෙ අවුරුදු හය දාහකට ඉස්සෙල්ලා මැවුවාය කියලා විස්වාස කරන අයත් මිලියන ගණන් ඉන්නවා. මේවා ඇත්ත කියලා ප්‍රියා ද සිල්වාත් විස්-වාස කරනවාද දන්නෙ නැහැ.

ග්‍රහයන්ගේ ආකර්ෂණ බලය, හිරුගේ විද්‍යුත් බලය වගේ භෞතික බලවේග මේ ලෝකයේ ජීවි අජීවී හැමදේටම බලපානවා කියන එක මම පිළිගන්නවා. කේන්දරකාරයෙ-ා් කරන දේවල් කොතරම් දුරට මේ බලවේග ගැන විද්‍යාත්මක දැනීම කින් කරනවාද කියන එක ගැන වෙනම විවාදයක් කරන්න පුළුවන්.

ප්‍රියා ද සිල්වා නෝනාට කේන්දර බලලා කියපු දේවල් හරි නම් ඒක බොහොම හොඳයි. නමුත් පන්සල් ගිහිල්ලා බෝධිපූජා, පිරිත්, පිංකම් කරලා ග්‍රහ අපල දුරුකරගන්න හිතනවා නම් ඒක මම අදහන බුද්ධාගම නම් නෙවෙයි.

♦ කොල්වින් ජයසිංහ Watford, **UK**



**ඉරිදා** - ලෝක සෞඛ්‍ය සංවිධානෙන් කොටින්ට විටමින්
**SUN** විස්කෝතු යවල ඒවා හමුදාවෙන් මගදි අල්ලගෙන. දැන් ඒකට ආණ්ඩුවට බනිනවා. කොටින්ට නෙවෙයිලු ඒ පැත්තෙ ඉන්න අනාථ මිනිස්සුන්ටලු යැව්වෙ. ඒවා අර ඉස්සර අන්දා ආතගෙ කතා. මුළු ලෝකෙම හඳන්නෙ වැටෙන කොටියා ආයිත් උස්සලා තියන්න. සුනාමි ආධාර අස්සෙ බටහිර රටවල් කොටින්ට ආයුධයි රේඩියෝ උපකරණයි යැව්වා.කවුරුත් කියන ඒවා අහන්නෙ නැතුව ලංකාව යුද්ධය අපට ඕන විදියට කළා නම් මෙලහකට කොටි ඉවරයි. බටහිරින් එන විස්කෝතු, ගල් බනිස්, ඥානකතා වලින් රැවටෙන්න එපා කියලා අපේ ලොක්කන්ට කියලා යවන්න ඕන.

**සඳුදා** - ලංකාවෙ සමහරු තවම දන්නෙ නෑ, පොලව
**MON** බෝලයක් වගේය, රවුම්ය, කරකැවෙනවයි කියලා. තවම හිතන්නෙ පොළව රොටියක් වගේ පැතලිය කියලා. ඒ ගනයට අපේ ලොකු නංගිලත් වැටෙනවා. ලංකාවෙ වෙලාව උදේ නමය නම් මුළු ලෝකෙ හැම රටකම ඒ වෙලාවෙ නමයයි කියලා ඒ ගොල්ල හිතන්නෙ. මෙහේ පාන්දර තුනට ටෙලිපෝන් එක වදිනවා. බලන කොට නංගි. ඉතිං අක්කෙ කොහොමද? කියලා අහනවා. මං කිව්වා, යකෝ මේ එළිවෙන ජාමෙ. උඹලට මොළයක් නැද්ද? කියලා. ඒ පාර කියනවා, ඒවුනාට මෙහේ උදේ නමයයි නේ අක්කෙ, කියලා. මම ටෙලිපෝන් එක සහ මුලින්ම ගලවලා දැම්මා. එළිවෙනකල් නින්ද ගියේ නෑ.

**කුජදා** - අබිරහස් කියන්නෙ කවදාවත් එළිවෙන්නෙ නැති,
**TUE** කවදාවත් කාටවත් හිතාගන්න බැරි රහස් වලට. හැම දාම ඒවා රහස් හැටියට තියේවි.ඒ වගේ කාටවත් තවම හිතා ගන්න බැරිවෙච්ච රහස් දෙකක් තියනවා. පළමුවෙනි අබිරහස මේකයි. කොටි ත්‍රස්තවාදියො මෙච්චර මිනීමරද්දිත්, උන්ව ලංකාවෙ තහනම් කරන්න කියලා මෙච්චර කට කැඩෙන කල් කියද්දිත්, ඇයි ලංකා රජය උන්ව තහනම් කරන්නෙ නැත්තෙ? හොඳ නැකතක් එන කල් ඉන්නවද? අනෙක් අබිරහස මර්වින් සිල්වා අච්චර පාහර විදියට හැසිරිලත් කිසිම දඬුවමක් දෙන්නෙත් නැතුව තවම ඇමතිකමේ තියාගෙන ඉන්නෙ ඇයි? මේව තමයි ලංකාවෙ කවදාවත් එළිවෙන්නෙ නැති අබිරහස්. කවුරුවත් දන්නෙ නෑ. අනේ මංකෙඳාක්කා!

**බුදදා-** නයනයි රෝහණයි ලංකාවෙ මාස හතරක් ඉඳලා
**WED** ආපහු ලන්ඩන් ඇවිත් පෙරේදා අපේ ගෙදර ආවා. රෝහණ මෙහෙම කතාවක් කිව්වා. මර්වින් සිල්වා නිතරම ඉන්නෙ අරලියගහ මැදුරෙලු. ජනාධිපතිට එන ටෙලිපෝන් කෝල්වලට සෙකට්‍රිටත් ඉස්සෙල්ලා පැනලා උත්තර දෙන්නෙ මර්වින්ලු. ජනාධිපතිතුමාට කතාකරන්න පුළුවන්ද? කියලා කවුරුහරි ඇහුවම, මර්වින් අහනවලු, තමුසෙ කවුද? මොකක්ද කාරණේ? දැන් කතාකරන්න බෑ.. ප්‍රසිඩන්ට් බිසී. එහෙම කියලා ලයින්එක කපනවලු. මේ දේවල් ටෙම්පල් ට්‍රීස් එකේ ස්ටාෆ් එක ඔක්කොම දන්නවා. සමහර විට ජනාධිපති දන්නෙ නැතුව ඇති. කවුරුත් කට පියාගෙන ඉන්නවා. ඔන්න අපේ රටට ගිය කල! මර්වින් අරලියගහ මන්දිරයට තියා අම්බලම කටවත් වැද්දගත යුතු මිනිහෙක්ද?

**ගුරුදා** - ලන්ඩන්වල ඉන්න කොටි ත්‍රස්තවාදීන්ට සපෝට්
**THU** කරන දෙමළසංගමයක් දැන් මෙහේ ඉන්න තමන්ගෙ දෙමළ වර්ගයෙන් ඉල්ලා සිටිනවා, ලංකාවට යනව නම් ශ්‍රීලන්කන් එයාර් ලයින් වල යන්න එපා, ඒක වර්ජනය කරන්න කියලා. එහෙම වර්ජනය කරලා ලංකා රජයට හැකිතරම් ආර්ථික වශයෙන් පාඩු කරන්නලු. දෙමළ මිනිස්සු ඒ ඉල්ලීම පිළිගත්තු බවක් නම් පේන්න නෑ. කොහොමත් කොටි හැමදාම කළේත්, තවමත් කරන්නෙත් ලංකාව විනාස කරන එක තමයි. ඒත් උන්ට තවම බැරිවුණා අපේ හමුදාවෙ ධෛර්‍යය බිඳින්න.

**සිකුරාදා** - ලංකාව නිදහස ලබලා අවුරුදු හැටක් සැමරීම
**FRI** ගැන එක් එක්කෙනා කියන කතා අතරට අපේ ආතර් මාම මෙළහදි කියපු කතාව තමයි හොඳම එක. මාම කියනවා නිදහස ලැබිච්ච දවසෙ ඉඳලාම රටේ නායකයො, දේසපාලකයො ඉදිරියට ලංකාව සංවර්ධනය කරන හැටි ස්ටේජ් වල කියාපු අලංකාරෙටම වැඩත් කළා නම් ලංකාව පුදුම විදියට ස්වයංපෝෂිතය, එහෙනම් මේවෙන කොට ඇමරිකන් ජනාධිපතිවරු පවා පාට් ටයිම් ජොබ් ඉල්ලගෙන ලංකාවට ඒවිය කියලා.

**ශනිදා** කොටුවෙ ස්ටේෂමේ බෝම්බෙන් කොළඹ ස්කෝ-
**SAT** ලෙක ළමයි අට දෙනෙක් මැරුණා. බුත්තල, අනුරාධපුරේ බෝම්බ වලින් තව කොච්චර මැරුණද? අපි මෙහාට වෙලා ඒ ප්‍රවෘත්ති අහ අහ ඉන්නවා. නමුත් එහේ අපේ මිනිස්සු මොනතරම් ගින්දරෙන්ද ඉන්නෙ ? මොනතරම් බයෙන්ද පාරෙ යන්නෙ? මෙහේ ඉන්න හුඟ දෙනෙක් පොඩ්ඩ එහා මෙහා වෙන්න ඉස්සර වෙලා ලංකාවෙ ඉන්න මිනිස්සුන්ට දොස් කියනවා. ඒ සේරම කරදර අස්සෙ ඒව විඳගෙන තවම ඒඅය එහේ ඉන්නවා. අපි වගේ රට දාලා ආවෙ නැහැ. ධෛර්‍යය අතින් ඒ මිනිස්සුන්ට අලගු තියන්නවත් අපිට බැහැ.